www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 3 වන කොටස

## The Historical and International Foundations of the Socialist Equality Party—Part 3

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

### ‘තනිරටේ සමාජවාදයේ’ ප්‍රති විපාක

44. ට්‍රොට්ස්කි හා වාමාංශික විපාර්ශවය, සෝවියට් සංගමය තුල නිවැරදි ආර්ථික පිලිවෙතක් ක්‍රියාවට නැගීම සඳහා සටන් වදින අතර තුර, අවධාරනය කලේ විප්ලවවාදී පාලන තන්ත්‍රයේ ඉරනම තීන්දු වනු ඇත්තේ සෝවියට් සංගමයේ සීමාවලින් ඔබ්බට විප්ලවය ප්‍රසාරනය කිරීම මත බවය. යුරෝපයේ සහ උතුරු ඇමරිකාවේ රටවල කම්කරු පන්තිය බලය අල්ලා නොගත හොත් සෝවියට් රාජ්‍යය ඉතුරුවනු නැතැයි වාම විපාර්ශවය පෙන්වා දුන්නේ ය. වාම විපාර්ශවය සහ ස්ටැලින්වාදී නිලධරය අතර ඝට්ටනය සංකේන්ද්‍රනය වූයේ හරියටම මේ ප්‍රශ්නය වටා ය. බුඛාරින්ගේ සහාය ලත් ස්ටැලින් සෝවියට් සංගමය තුල ජාතිකවාදී පදනමක, සමාජවාදය ගොඩනැගිය හැකි යයි 1924 දී පෙන්වා දුන්නේ ය. “තනි රටක සමාජවාදය” පිලිබඳ න්‍යායේ පැනනැගීම නියෝජනය කලේ ඔක්තෝබර් විප්ලවය පදනම්ව තිබුනා වූ, මාක්ස්වාදයේ අතිමූලික ප්‍රයත්නයක් ප්‍රතික්ෂේප කිරීමයි. එය සෝවියට් සමාජවාදී සමූහාන්ඩුවේ ඉතිහාසයේ තීරනාත්මක මං සන්ධියක් වූයේ යඃ නිලධරය මෙතැන් සිට සෝවියට් සංගමයේ පිලිවෙත් ලෝක සමාජවාදී විප්ලවයෙන් වෙන් කලේය. ජාතික සමාජවාදයේ ක්‍රියාමාර්ගය තුලින් ප්‍රකාශනයක් අත් කර ගත්තේ නිලධරයේ ම භෞතික අවශ්‍යතාවන් ය. රාජ්‍ය දේපල නිලධර තන්ත්‍රයේ ආදායමේ ද වරප්‍රසාදවල ද උල්පත වූ තාක් දුරට, සාරභූත වශයෙන්ම ආරක්ෂාවාදී වූ ජාතික පිලිවෙතක් ස්ටැලින්වාදී තන්ත්‍රයට සේවය කලේ ය. විදේශ ප්‍රතිපත්තිය පිලිබඳ ක්ෂේත්‍රයේ දී “ජාතික අවශ්‍යතාවය” පිලිබඳ අවස්ථාවාදී ගනන් බැලීම් වැලඳගෙන, සප්‍රතිපත්තික ජාත්‍යන්තරවාදී උත්සුකයන් ඉවත දමන ලදී. වඩාත් විවෘත ලෙස, ස්ටැලින්වාදී තන්ත්‍රය කොමියුනිස්ට් ජාත්‍යන්තරය සාරභූතව ම ජාතිකවාදී වූ සෝවියට් විදේශ පිලිවෙතක උපකරනයක් බවට පත් කරනු ලැබිනි. කොමියුනිස්ට් පක්ෂ ධනේශ්වර ආන්ඩුවලට බලපෑම් දැමීම සඳහා උපයෝගී කර ගත්තේය. අන්තිමේ දී ස්ටැලින්වාදී පක්ෂ, දේශපාලන ප්‍රතිවිප්ලවයේ උපකරන බවට ප්‍රතිවර්තනය කල, පන්ති සහයෝගිතා පිලිවෙත්වල උපත පැවැත්තේ මෙතැන ය.

45. සෝවියට් ප්‍රතිපත්ති මාරුවේ ජාත්‍යන්තර විපාක, 1926 මැයි බ්‍රිතාන්‍යයේ ජෙනරල් ස්ට්‍රයිකයේ පරාජයෙන් විදහා දැක්වුනි. බ්‍රිතාන්‍ය වෘත්තිය සමිතිවල ජාතික නායකත්වයේ අනුග්‍රහය අපේක්ෂා කල ස්ටැලින්, මහා වැඩ වර්ජනය සැකසෙමින් පැවති තත්වයේ දී හා එය තුලදී ම ද නිලධරය විසින් පාලනය කල එරට ටියුසීයට (වෘත්තීය සමිති සම්මේලනය) අවිවේචනාත්මකව සහය දිය යුතු යැයි බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය ඇනවිය. මින් සිදු වූයේ ටියුසීය වැඩ වර්ජනය පාවා දෙන විට, ඊට මුහුන දිය නොහැකි තත්වයකට කම්කරු පන්තිය ඇද දැමීම ය.

46. මෙම පිලිවෙත ඊටත් වඩා විනාශයන්ට මග පෑදුවේ ය. සෝවියට් මධ්‍යම කාරක සභාව නොනවතින විප්ලව න්‍යායට එරෙහි ප්‍රහාරයක් දියත් කරමින්, ධනේශ්වර වර්ධනය කල් පසු වූ රටවල් තුලදී මෙන්ෂෙවිකයන්ගේ විප්ලවයේ අවධි දෙකේ න්‍යාය පුනර්ජීවනය කලේ ය. 1925-1927 අතර කාලයේදී ස්ටැලින් විසින් චීන කොමියුනිස්ට් පක්ෂය, අධිරාජ්‍යවාදයට එරෙහිව “පන්ති හතරේ සන්ධානය” පිලිබඳ න්‍යායට අනුව ජාතික ධනේශ්වරයේ කුවෝමිංටානයට ආධාර කිරීම කරා මෙහෙය විය. ට්‍රොට්ස්කි මෙම පන්ති සහයෝගිතා පිලිවෙතට තදින් ම විරුද්ධ වූ අතර, චීනයේ සමාජවාදී විප්ලවයට ඉන් අත් විය හැකි විනාශකාරී විපාක පෙන්වා දුන්නේ ය. අධිරාජ්‍යවාදය විසින් චීනය පීඩනයට ලක් කරමින් පවතීය යන කාරනය එරට තුල ධනපති පන්තිය සහ කම්කරු පන්තිය අතර ඝට්ටනය කිසිසේත් ම අඩුකර දැමුවේ නැත. සත්තකින් ම ප්‍රතිඵලය වූයේ එහි ප්‍රතිවිරුද්ධයයි. ට්‍රොට්ස්කි මෙසේ ලිවී යඃ

> --චීන ධනේශ්වරයේ, නිලධරයේ හා මිලිටරියේ බලගතු කොටස් ඔවුන්ගේ ඉරනම

අධිරාජ්‍යවාදය සමඟ බද්ධ කර ගැනීමේදී, ප්‍රබල සාධකයක් වූයේ චීනය තුල විදේශ ප්‍රාග්ධනයේ භූමිකාවයි.. එසේ නොවන්නට වත්මන් චීනය තුල මිලිටරිවාදීන් යයි කියනු ලබන කොටසේ දැවැන්ත භූමිකාව කිසිසේත් ම ඉටු කිරීමට නොහැකි වනු ඇත.

--චීනය තුල විදේශ ප්‍රාග්ධනයේ ඒජන්සිය වූ කොම්ප්‍රදෝරු යයි නම් කරනු ලැබ ඇති ධනේශ්වර කොටස සහ ඊනියා ජාතික ධනේශ්වරය අතර අගාධයක් පවතී යයි විශ්වාස කිරීම ද බොළඳ කමක් වනු ඇත. නැත, මෙම කොටස් දෙක අතර පවත්නා සම්බන්ධතාවය, ධනේශ්වරය සහ කම්කරු හා මහා ගොවි ජනතාව අතර පවත්නා සම්බන්ධයට වඩා අපරිමිත ලෙස සමීපය.

--අධිරාජ්‍යවාදයට එරෙහි විප්ලවවාදී අරගලයෙන් තොරව, අධිරාජ්‍යවාදය යාන්ත්‍රික ආකාරයකට පිටත සිට කරන බලපෑම මගින් චීන සමාජයේ සියලු පන්තීන් තලා ඒකාබද්ධ කරනු ඇතැයි සිතීම ඝෝර වැරැද්දකි. එය පන්තීන් අතර දේශපාලන වෙනස්කම් සමහන් කරනවාට වඩා උග්‍ර කරනු ඇත.[30]

47. ට්‍රොට්ස්කිගේ අනතුරු හැඟවීම් සනාථ විය. 1927 අප්‍රේල් මාසයේ දී චියාං කායි-ෂෙක්ගේ නායකත්වය ලද කුවෝමිංටාන හමුදාව, ෂැංහයි කම්කරු පන්තියට එරෙහි සංහාරයක් දියත් කලේය. ජාතික ධනේශ්වර හමුදාවෝ චීන කොමියුනිස්ට් පක්ෂ නායකත්වයේ විශාල කොටසක් මරා දැමූහ. 1927 අප්‍රේල් මාසයෙන් පසු වොං චිං-වෙයිගේ නායකත්වයෙන් යුතු "වාම" කුවෝමිංටානයට ඇතුලුවන ලෙස චීන කොමියුනිස්ට් පක්ෂය අනවන ලදී. වොං චිං-වෙයි, චියාං කායි-ෂෙක් පරයා යන මෘගත්වයකින් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ව්‍යාපාරය මර්දනය කලේ ය. චීන කොමියුනිස්ට් පක්ෂය මුලුමනින්ම අධෛර්‍යයට පත්වීමෙන් පසුව 1927 අගෝස්තුවේ දී, කොමින්ටර්නයේ (තුන්වන ජාත්‍යන්තරය) නායකයෝ එම පක්ෂය වහාම සන්නද්ධ නැගිටීමකට යා යුතු බව කියා සිටියේ ය. කැන්ටන් නගරයේ දී මෙවන් පිලිවෙතක් ක්‍රියාත්මක කිරීමට දරන ලද තැතක් දින තුනක් ඇතුලත ලෙයින් මඩින ලදී. 20 වන සියවසේ ඉතිහාසය කෙරේ ඒ සා සුවිසල් බලපෑමක් ඇති කිරීමට හේතුභූත වූ මෙම ව්‍යසනකාරී සිද්ධීහු චීන කොමියුනිස්ට් පක්ෂයට එරට කම්කරු පන්තිය තුල පෘථුල පක්ෂයක් ලෙස තිබුනු තත්වය මුලුමනින්ම අහෝසි කර දැමීය. ස්ටැලින්ගේ පිලිවෙත් විසින් පටවන ලද මෙම විනාශයන්ගෙන් ගැලවීම සඳහා පිටිසර පලාත්වලට පලාගිය කොමියුනිස්ට් පක්ෂ නායකත්වයේ ඉතිරි කොටස් - මෙයට මාඕ සෙඩොං ද ඇතුලත් විය - කොමියුනිස්ට් පක්ෂය ගොවි ජන පදනමකින් යුත් සංවිධානයක් ලෙස අලුතින් පිහිටුවා ගත්හ. ධනේශ්වර සූරාකෑමේ ගොරතර ම ස්වරූපයන් ගේ මුර තිප්පලක් බවට පත්ව ඇති චීනයේ වත්මන් තත්වයන් ද ඇතුලු එරට පසුකාලීන ඉතිහාසය වටහාගැනීම කල හැකි වන්නේ ස්ටැලින්ගේ "පන්ති හතරක සන්ධානය" පිලිබඳව ට්‍රොට්ස්කි විසින් කරන ලද විවේචනය ද චීනයේ විප්ලවයන්ට (ස්ටැලින්වාදීන් විසින්) 1927 දී අත් කර දෙන ලද ඛේදජනක ඉරනම ද පිලිබඳ සන්දර්භය තුල ම පමනකි.

## ට්‍රොට්ස්කි පිටුවහල් කිරීම

48. බ්‍රිතාන්‍යයේ දී හා චීනයේ දී ලද පරාජයන් සෝවියට් කම්කරු පන්තියේ ආත්ම විශ්වාසය අඩු කිරීමට ද අනෙක් අතට නිලධරය ශක්තිමත් කර කම්කරු පන්තියෙන් එහි හුදෙකලා වීම තවත් ගැඹුරු කලේය. සෝවියට් සංගමය තුල බලය ස්ටැලින් ප්‍රධාන නිලධාරිවාදී නායකත්වය අතට සංකේන්ද්‍රනය විය. 1926 දී වාම විපාර්ශවය ඒකාබද්ධ විපක්ෂයක් ලෙස සිනොවියෙව් සහ කමනෙව් සමග කෙටි කලකට එක්සත් විය. 1926 ජූලි-ඔක්තෝබර් මාසවල දී කමනෙව් ද ට්‍රොට්ස්කි ද දේශපාලන කමිටුවෙන් (පොලිට් බියුරෝවෙන්) ඉවත් කරන ලදහ. 1927 නොවැම්බරයේ දී ට්‍රොට්ස්කි හා සිනෝවියෙව් කොමියුනිස්ට් පක්ෂයෙන් පලවා හරිනු ලැබූහ. දෙසැම්බරයේ දී වාම විපාර්ශවයේ සියලු ආධාරකරුවෝ පක්ෂයෙන් නෙරපා හරිනු ලැබූහ. කමනෙව් හා සිනොවියෙව් ඉක්බිති ස්ටැලින්ට යටත් වූ අතර කොමියුනිස්ට් පක්ෂයට යලිත් එක් වූහ. 1928 ජනවාරියේ දී ට්‍රොට්ස්කි අල්මා අටා (සයිබීරියාවේ පිටිසර ප්‍රදේශයකට) වලට පිටුවහල් කරනු ලැබ, 1929 පෙබරවාරියේ දී සෝවියට් සංගමයෙන් ද පිටුවහල් කරනු ලැබින.

49. අවසන් වශයෙන් ට්‍රොට්ස්කි පිටුවහල් කල තැන් ආරම්භයේ පටන් ම, ඔහු අවධාරනය කලේ ස්ටැලින්වාදී කල්ලිය ද වාම විපාර්ශවය ද අතර මතභේදයන් පැන නැංගේ, සමාජවාදය පිලිබඳව දරා සිටි කිසිසේත් ම සමනය කල නොහැකි වෙනස් වූ මතයන් දෙකකින් බව ය. ස්ටැලින්වාදීන්ගේ ආරම්භක ස්ථානය වූයේ රුසියාවේ සම්පත් මත පදනම්ව, හුදෙකලාවූ ජාතික සමාජවාදී සමාජයක් තැනීමය. වාම විපාර්ශවය අවධාරනය කලේ, රුසියාවේ කම්කරු රාජ්‍යයේ ඉරනම හා එය සමාජවාදය කරා වර්ධනය වීම, ලෝක සමාජවාදී විප්ලවයේ වර්ධනය සමග අනිවාර්ය ලෙස බැඳී පැවැති බව ය. අවුරුදු දෙකකට පෙර තමා ලියූ නොනවතින විප්ලවය යන නම ලද පොත් පිංචක ජර්මානු මුද්‍රනයේ ප්‍රස්තාවනාවක ට්‍රොට්ස්කි මෙසේ සාරාංශ කලේ යඃ

> --මාක්ස්වාදය සිය ආරම්භක ලක්ෂය ලෙස ගන්නේ ලෝක ආර්ථිකය, ජාතික කොටස් වල එකතුවක් ලෙස නොව, ජාත්‍යන්තර ශ්‍රම විභජනය ද ලෝක වෙළඳපල ද මගින් නිර්මානය කරන ලද දැවැන්ත හා ස්වාධීන යථාර්ථයක් ලෙස හා අපගේ යුගයේදී ජාතික වෙළඳපොලවල් තුල අනුල්ලංඝනීය ආධිපත්‍ය පවත්වන්නක් ලෙසය. ධනේශ්වර සමාජයේ නිෂ්පාදන බලවේගයෝ බොහෝ කලකට පෙර ම, ජාතික සීමාවන් ඉක්මවා ඇත්තාහ. (1914-1918) අධිරාජ්‍යවාදී යුද්ධය මෙම කාරනයේ එක් ප්‍රකාශනයක් වූයේ ය. නිෂ්පාදන තාක්ෂනය සම්බන්ධයෙන් ගත් කල්හි, සමාජවාදී සමාජය ධනවාදයට වඩා ඉහල අවධියක් නියෝජනය කල යුතු ම ය. ජාතික වශයෙන් හුදෙකලා වූ සමාජවාදී සමාජයක් ගොඩ නැගීම අරමුනු කර ගැනීමේ අර්ථය, අත් කර ගන්නා සියලු සාර්ථකත්වයන් තිබියදී ද, ධනවාදය හා සම කරනු ලැබු කල්හි පවා නිෂ්පාදන බලවේගයන් පසු පසට ඇද දැමෙන්නේය යන්නය. ලෝක ඒකකයේ කොටසක් වන්නාවූ, රටෙහි වර්ධනයේ භූගෝලීය, සංස්කෘතික හා ඓතිහාසික තත්වයන් නොතකා, ජාතික ආකෘතියක් තුල, ආර්ථිකයේ සියලු ශාඛාවල තුලිත අනුපාතික බවක් තහවුරු කර ගැනීමට උත්සහා කිරීමේ අර්ථය වන්නේ ප්‍රතිවිප්ලවවාදී මනෝ රාජ්‍යයක් කරා ධාවනයකි. [31]

50. ස්ටැලින්ගේ ජාතික සමාජවාදී ඉදිරිදර්ශනය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විචාරයේ දේශපාලන ගම්‍යයෝ සෝවියට් පිලිවෙතේ ගැටලු ඉක්මවා ඉන් ඔබ්බට විහිද ගියේ ය. පරදුවට තැබුනේ අධිරාජ්‍යවාදී යුගයේ ලෝක කම්කරු පන්තියෙහි භූගෝලීය පර්යාලෝකය සහ මූලෝපායික කර්තව්‍යයන් පිලිබඳ මූලික ප්‍රශ්නය ට්‍රොට්ස්කි මෙසේ පැහැදිලි කලේ ය.

> --සමාජවාදී විප්ලවය ජාතික දේශ සීමාවන් තුල සම්පූර්න කිරීම ගැන සිතීමට වත් නොහැකි ය. ධනේශ්වර සමාජ අර්බුදයේ මූලික හේතු අතරින් එකක් නම් එය විසින් නිර්මානය කරනු ලැබ ඇති නිෂ්පාදන බලවේගයන්, ධනේශ්වර ජාතික රාජ්‍යයේ සැකිල්ල සමඟ තවදුරටත් සමහන් කල නොහැකි වීමය. මෙයින් එක් අතකට ගලා එන්නේ, අධිරාජ්‍යවාදී යුද්ධයන් ය. අනිත් අතට යුරෝපයේ ධනේශ්වර එක්සත් ජනපදයක් පිලිබඳ මනෝරාජ්‍යය ය. සමාජවාදී විප්ලවය ජාතික ක්ෂේත්‍රය තුල ආරම්භ වී, ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුල විකසිත වන අතර ලෝක කරලියේ පරිපූර්නත්වයට පත්වෙයි. මේ අනුව සමාජවාදී විප්ලවය වචනයේ වඩාත් පෘතුල හා නව අර්ථයකින් නොනවතින විප්ලවයක් බවට පත් වෙයි. එය පරිපූර්නත්වය ලබන්නේ අපගේ සමස්ථ ග්‍රහලෝකය තුල නව සමාජයේ අවසන් විජයග්‍රහනය තුල ම පමනි.” [32]

ජාත්‍යන්තර වාම විපාර්ශවයේ මුල් කාලීන අරගලයෝ

51. වාම විපාර්ශවය රුසියානු කොමියුනිස්ට් පක්ෂයෙන් පිටත ද සහයෝගය දිනාගත්තේ ය. *කොමින්ටර්නයේ (කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ) කෙටුම්පත් ක්‍රියාමාර්ගය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විචාරය* - මෙය 1928 හය වන සම්මේලනය සඳහා සූදානම් කරන ලද්දකි - වාසනාවකට මෙන් පරිනත විප්ලවවාදියෙකු හා ඇමරිකානු කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භක සාමාජිකයා වූ ජේම්ස් පී. කැනන්ගේ අතට වැටුනු කල්හි, වැදගත් ආරම්භකත්වයකට ඉඩ පෑදිනි. ලියවිල්ල හැදෑරූ පසු කැනන් ද මොරිස් ස්පෙක්ටර් නමැති කැනේඩියානු විප්ලවවාදියා ද ට්‍රොට්ස්කිගේ ආස්ථානය සඳහා සටන් කිරීමට තීරනය කලෝ ය. ඇමරිකා එක්සත් ජනපදයට ආපසු විත් ටික කලකට පසු, මැක්ස් ෂැට්මන් සහ මාර්ටින් ඇබර්න්ගේ ද සහයෝගය ඇතිව කැනන්, කොමියුනිස්ට් පක්ෂය තුල වාම විපාර්ශවයේ ආස්ථානයන් සඳහා අරගලයට මුල පිරීය. කැනන් විසින් ලියන ලද ප්‍රකාශයක් ෂැට්මන් හා ඇබර්න් විසින්, 1928 ඔක්තෝබර් 27 වන දින කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන කමිටුවට ඉදිරිපත් කරන ලදී. එය මෙසේ ප්‍රකාශ කලේ යඃ

> මාක්ස් ලෙනින්වාදී න්‍යායේ මූලයන්, තනිරටක සමාජවාදය පිලිබඳ සාවද්‍ය න්‍යාය මගින් සංශෝධනය කිරීමට දරන ලද ප්‍රයත්නයන්ට, ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ විපාර්ශවය නිවැරදි ලෙස විරුද්ධත්වය පලකොට තිබේ. කොමින්ටර්නයේ ක්‍රියාකාරිත්වයෙහි හා පොදු දෘෂ්ටිවාදාත්මක ක්ෂේත්‍රයන් හි විවිධ අංශවල, අවස්ථාවාදී හා සංශෝධනවාදී වැරදි ගනනාවක් ම ගලා එන්නේ එම සාවද්‍ය න්‍යායෙනි. අඩු වශයෙන් එක්තරා ප්‍රමානයකට හෝ චීන විප්ලවය තුල ඉදිරිපත් කර ඇති සාවද්‍ය පිලිවෙත, ඇංග්ලෝ-රුසියානු කමිටුවේ (බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති නිලධරය සමග අටවාගත්) ව්‍යසනය, කොමින්ටර්නය තුල බිය එලවන සුලු හා පෙර නොවූ විරු නිලධාරීකරනය, සහ සෝවියට් සංගමය තුලම ගෙන යනු ලබන සාවද්‍ය පිලිවෙත් යනාදිය මෙහි ප්‍රතිඵලයක් වේ. මෙම නව සාවද්‍ය පිලිවෙත, ධනවාදයේ තාවකාලික ස්ථාවරීකරනයේ බලය හා අඛන්ඩ පැවැත්ම

ගැන පවත්නා අධිතක්සේරුවක් හා බැඳී පවතී. ලෝක විප්ලවයේ වර්ධනය පිලිබඳ මොවුන්ට පවත්නා අශුභවාදයේ සැබෑ උල්පත පවත්නේ ද මෙහිම ය. කොමින්ටර්නයේ සෑම පක්ෂයකම, සෑම කොමියුනිස්ට්වාදියේකුගේ ම ප්‍රධානතම යුතු කමක් වන්නේ විපාර්ශවය හා අත්වැල් බැඳ ගනිමින් මේ ප්‍රශ්නය පිලිබඳ මාක්ස්, එංගලස් හා ලෙනින්ගේ උගැන්වීම් මත පිහිටා සටන් වැදීම ය. [33]

52. දේශපාලන කමිටුවේ එම සැසිවාරයේ දී ම කැනන් පන්නා දමන ලදී. ඔහු ඇමරිකාවේ කොමියුනිස්ට් ලීගය පිහිටුවීමට පියවර ගත්තේය. ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදයේ වර්ධනය උදෙසා ඉමහත් සේවාවක් ඉටුකල එය පිහිටුවන ලද්දේ ප්‍රගාඪ ලෙස සප්‍රතිපත්තික වූ පදනමක ය. එහි ආරම්භක ලක්ෂ්‍යය වූයේ සංවිධානාත්මක ප්‍රශ්න හෝ ජාතික උපායයන් නොවේ. ජාත්‍යන්තර විප්ලවවාදී මූලෝපායෝ තීරනාත්මක ප්‍රශ්නයන් ය. කැනන්ට ආවේශය සැපයු ට්‍රොට්ස්කිගේ කෙටුම්පත් ක්‍රියාමාර්ගය පිලිබඳ විචාරය, ස්ටැලින් නායකත්වයේ ජාතිකවාදී යොමුව හා 1917 ඔක්තොබර් විප්ලවයෙන් පසු ජාත්‍යන්තර කම්කරු පන්තියේ මූලෝපායික අත්දැකීම් තක්සේරු කිරීමට ඔවුන් අසමත් වීම පිලිබඳ චෝදනා පත්‍රයක් විය. ලෝක දේශපාලන හා ආර්ථික තත්වය පිලිබඳ සිය තක්සේරුවේ දී ට්‍රොට්ස්කි ඇමරිකානු අධිරාජ්‍යවාදයේ නැගීම පිලිබඳව විශ්ලේෂනයක් නොකිරීම ගැන කොමින්ටර්නයේ කෙටුම්පත් ක්‍රියාමාර්ගය විවේචනයට ලක් කලේ ය. සිය ලෝකාධිපති තත්වය පිහිටුවා ගැනීම හා තහවුරු කර ගැනීම සඳහා ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අරගලය හා එහි ගම්‍යයන් පිලිබඳව ට්‍රොට්ස්කි අවධාරනය කලේ ය. එක්සත් ජනපදය තුල ප්‍රමුඛ පෙලේ ආර්ථික අර්බුදයක් පෙරදුටු ට්‍රොට්ස්කි, ඇමරිකාව ලෝක දේශපාලනය තුල දරන්නා වූ අධිපති තත්වය ඉන් ලිහිල් කරනු නැති බව පැවසී ය.

--සත්‍යතත්වය මෙහි ප්‍රතිකූලය ය. උත්පාතයේ කාලපරිච්ඡේදයට වඩා ආධිපත්‍යයේ අර්බුදය පිලිබඳ කාල පරිච්ඡේදයක දී එක්සත් ජනපදය වඩාත් සම්පූර්නව, විවෘතව සහ නිර්දයව ක්‍රියා කරනු ඇත. එක්සත් ජනපදය, තමන්ගේ දුෂ්කරතා හා ව්‍යාධීන් යුරෝපයේ වියදමින් විසඳ ගැනීමට යත්න දරනු ඇත. මෙය සිදුවන්නේ ආසියාවේ, කැනඩාවේ, දකුනු ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ හෝ යුරෝපයේම ද යන්න හෝ සාමයෙන් ද යුද්ධයෙන් ද යන්න නොතකා එය ක්‍රියාත්මක වනු ඇත.”[34]

53. 1929 ඔක්තෝබරයේ වෝල් වීදියෙහි බිඳවැටීම, ධනවාදයේ ඉතිහාසයෙහි අත් දුටු ගොරතරම අර්බුදයට එය ඇද දැමූ භූගෝල පරිමාන අවපාතයක ආරම්භය සලකුනු කලේය. පලමුවන ලෝක යුද්ධය අවසන්ව යන්තම් දශකයකට වැඩි කාලයකට පසුව, 1930 ගනන්වල අර්බුදය ද, ඉන් පැන නැගි ලේවැකි සමාජ හා දේශපාලන පෙරලි, සංශෝධනවාදීන් සහ ප්‍රතිසංස්කරනවාදීන්ගේ උදාසීන ගොඩවෙදකම් සියල්ල කුඩුපට්ටම් කර දමන්නාවූ තවත් ප්‍රතිෂේධනයක් විය. යුරෝපයේ, ආසියාවේ පමනක් නොව උතුරු ඇමරිකාවේ ද ධනවාදය එහිම ප්‍රතිසතිතාවන්ගෙන් බිඳවැටීමේ අද්දරට ගෙන එනු ලැබිනි. එවන් වූ නොමිනිය හැකි මිනිස් ජීවිත විනාශයක් මැදින් ධනවාදය පන බේරා ගැනීම පිලිබඳ වගකීම පැවැරෙන්නේ ස්ටැලින්වාදීන් හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් නායකත්වය දුන් කම්කරු පන්තියේ පෘථුල සංවිධානවල දේශපාලන පාවාදීම් මතට ය. හතරවන ජාත්‍යන්තරය පැන නැගුනේ මෙම පාවාදීම්වලට එරෙහිව ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ ගෙනගිය අරගලයක් තුලිනි. මෙම අරගලයන්ගේ වාර්තාව හා පාඩම් අද දක්වා ම මාක්ස්වාදීන් උගන්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය දේශපාලන හා න්‍යායික පදනම සම්පාදනය කරන්නේ ය.

54. 1929 දී තුර්කියට පැමිනීමෙන් පසුව ද ලියොන් ට්‍රොට්ස්කි, සෝවියට් සංගමය තුල සැලසුම් සහගත හා සහේතුක කාර්මීකරන ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් සටන නොනවත්වා ම කරගෙන ගියේ ය. ජාත්‍යන්තර වාම විපාර්ශවයේ අරමුන වූයේ සෝවියට් සංගමයේ පාලන තන්ත්‍රය දේශපාලනිකව ප්‍රතිසංස්කරනය කිරීම ද කොමියුනිස්ට් ජාත්‍යන්තරය මාක්ස්වාදී මුලධර්ම මත පදනම් වූ නිවැරදි දේශපාලන පිලිවෙත් කරා ආපසු හැරවීම ද විය. 1920 ගනන්වල අග භාගයේ දී, ගොවි ජනතාව නගරවලට ආහාර සැපයීම වර්ජනය කිරීම මගින් ඇති කරන ලද මහා සාගත සමයේ දී, ස්ටැලිනවාදී නිලධරය ගොවි ජනයා දෙසට කලින් තිබුනු තම යොමුව මුලුමනින්ම ආපසු කරකවා, ඒ වෙනුවට සැලැස්මකින් තොර කාර්මීකරනයක් ද සාමූහිකකරනයක් ද “කුලැක් වරුන් (මහ ගොවියන්) පන්තියක් හැටියට වනසා දැමීමේ” ද මෘග පිලිවෙතකට පිලිපන්නේ ය. ආර්ථික ජාතිකවාදය හා හුදෙකලා රාජ්‍යයක ඉදිරිදර්ශන මත පදනම් ව දියත් වූ වේගවත් කාර්මික කරනයක් පිලිබඳ මෙම ක්‍රියාමාර්ගය, ලෝක ආර්ථිකයේ සම්පත් ප්‍රයෝජනයට ගැනීම හා ජාත්‍යන්තර ශ්‍රම විභජනයක් තුල ට්‍රොට්ස්කි යෝජනා කල රාජ්‍ය කාර්මිකකරනයට මොන යම්මැ හෝ සම්බන්ධයක් පැවැත්තේ නැත. දේශීය පිලිවෙතේ අති වාමවාදය සමඟ, “තුන්වන අවධිය” පිලිබඳ න්‍යාය මත පදනම්වූ කට්ටිවාදී දේශපාලන අතිධාවනකාරීත්වයක් වෙත කොමින්ටර්නයේ තියුනු හැරීම, බැඳී පැවතුනි. මෙම “න්‍යාය” මගින් විදහා දැක්වූ දේශපාලන ඉදිරිදර්ශනය, වඩාත් සංයුක්තව කිව හොත්

ප්‍රති න්‍යාය, පෙනී යන පරිදි සංකල්පනය කලේ, වෛෂයික සමාජ, ආර්ථික හා දේශපාලන සන්තතීන්ට අසම්බන්ධිත හා ප්‍රතිසතිතාවෙන් තොර අඛන්ඩව පවතින "ජනතා පෙරලිකාරිත්වයක්" ලෙස ය. ස්ටැලින්වාදීන් විසින් දේශපාලන මූලෝපායේ හා ක්‍රමවේදයේ සියලු ගැටලු හුදෙක් රැඩිකල් සටන් පාඨ දෙඩවීමක් බවට සිඳුවන ලදී. ස්ටැලින්වාදී අභ්‍යුපගමය මාක්ස්වාදී දේශපාලන විශ්ලේෂනය විකාරයක් බවට පත් කරන බවට ට්‍රොට්ස්කි අනතුරු ඇඟවීය. ඔහු මෙසේ ලිවීයඃ

> *සමස්තයක් ලෙස අපගේ යුගයේ දෘෂ්ටි* කෝනයෙන් විප්ලවය දෙසට කම්කරු පන්තිය තබන පියවර පිලිබඳව එය කිසිවක් නොකියා මඟහරියි. එහෙත් මෙය, ගැඹුරුවන ධනේශ්වර ප්‍රතිසතිතාවේ වෛෂයික සන්තතීන්ට වඩා වැඩි අනම්‍යතාවයකින් යුත් ප්‍රගමනයක් නො වේ. සංශෝධනවාදීන් දකින්නේ ධනේශ්වර මාවතේ ඉහල නැඟීම් පමනි. ගතානුගතික "විප්ලවවාදීන්" දකින්නේ එහි බැස යාම පමනි. එහෙත් මාක්ස්වාදීන්, යුද්ධයන්ගේ ව්‍යසනය ද, විප්ලවයන් පැන නැඟීම ද කෙරෙන් මෙහොතකට හෝ ඇස් ඉවතට නොගෙන, එකක් පසු පස තවෙකක් වශයෙන් පැමිනෙන එහි සියලු ඉහල හා පහල වැටීම් සහිත මාවත සමස්තයක් ලෙස ග්‍රහනය කරයි.[35]

## ජර්මනිය තුල ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය

55. "තුන්වන කාල පරිච්ඡේදයේ" බලපෑම යටතේ කොමියුනිස්ට් පක්ෂවලට උපදෙස් ලැබුනේ ඒවා කලින් අනුගමනය කල වෘත්තීය සමිතිවලට, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලට සහ ධනේශ්වර ජාතිකවාදීන්ට අනුගත වීමේ පිලිවෙත අත හැර ඒ වෙනුවට අතිවාමවාදී, ස්වාධීන "රතු" වෘත්තීය සමිති තනාගැනීම ද, එක්සත් පෙරමුනු උපාය අත් හැරීම ද ඇතුලත් අතිවාම පිලිවෙතක් අනුගමනය කල යුතු බවය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ "සමාජ ෆැසිස්ට්වාදී" යයි නම් කිරීමත් සමග එක්සත් පෙරමුනු උපාය අත හැර දමන ලදී.

56. කොමින්ටර්නයේ නව පිලිවෙත, ෆැසිස්ට්වාදය නැඟී එමින් තිබුනු ජර්මනිය තුල සමාජවාදී ව්‍යාපාරයට මාරක අභියෝගයක් එල්ල කල අතර, විනාශකාරී විපාක ගෙන දුන්නේය. ෆැසිස්ට්වාදය වනාහි ආර්ථික අර්බුදය විසින් විනාශ කරනු ලැබුවා වූ ද ප්‍රධාන පන්ති දෙක වූ ධනපති පන්තිය හා කම්කරු පන්තිය අතර මිරිකී තිබුනා වූ ද අපේක්ෂා භංගත්වයට පත් සුලුධනේශ්වරයේ ව්‍යාපාරයක් විය. කම්කරු පන්ති පරාජයන් මඟින් සුලුධනේශ්වරයේ පලල් කොටස්වලට ඒත්තු ගන්වනු ලැබුවේ, කම්කරු පන්තිය සිය ගැටලුවලට විසඳුමක් ඉදිරිපත් කරනවා වෙනුවට තමන්ගේ ගැටලුවල උල්පත වන බව ය. ජර්මන් ධනේශ්වරය කම්කරු සංවිධාන විනාශකර දැමීමටත්, කම්කරු පන්තිය ධූලි බවට පත් කිරීමටත් ෆැසිස්ට්වාදීන් යොදා ගත්හ. 1933 ජනවාරි මාසයේ හිට්ලර්ගේ නාසි පක්ෂයේ ජයග්‍රහනය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා ස්ටැලින්වාදය විසින් කල පාවාදීමේ ප්‍රතිපලය විය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෝ තම විශ්වාසය ධනේශ්වර වයිමාර් සමූහාන්ඩුව මත තැබූ අතර කම්කරු පන්තිය ධනපති රාජ්‍යයට ගැට ගසා දැමූහ. හිට්ලර්ගේ පක්ෂය ද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ද යන දෙක නිවුන්නුන් යයි ද සමාජ ෆැසිස්ට්වාදී යයි ද කියා පෑ ස්ටැලින්වාදී පිලිවෙත, කම්කරු පන්තිය සඳහා ආරක්ෂක පියවරක් වශයෙන් හෝ කොමියුනිස්ට් පක්ෂය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය අතර සහ ක්‍රියාකාරිත්වයක් පවත්වාගෙන යාම ප්‍රතික්ෂේප කලේ ය. එමඟින් තවමත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට හිතවත්ව සිටි කම්කරුවන් කොමියුනිස්ට් පක්ෂය වෙත දිනාගැනීමේ මොනම මාධ්‍යයක් හෝ ඊට අහිමි කලේය. කොමියුනිස්ට් පක්ෂ නායකයෝ සාපරාධීව ම උදාසීන "හිට්ලර්ට පසුව අපි" යන සටන් පාඨය ඉදිරිපත් කරද්දී ට්‍රොට්ස්කි එයට එරෙහිව 1931 දෙසැම්බරයේ දී මෙසේ අනතුරු හැඟවීයඃ "කම්කරු-කොමියුනිස්ට්වරුනි, ඔබ ලක්ෂ-දසලක්ෂ සංඛ්‍යාත වන්නාහු ය. ඔබට යා හැකි වෙනත් තැනක් නැත. ඔබට උවමනා තරම් ගමන් බලපත්‍ර ඇත්තේ නැත. ෆැසිස්ට්වාදය බලය අල්ලා ගත හොත්, එය ඔබේ හිස්කබල්වලට හා කොඳු ඇටවලට උඩින් භයංකර යුද ටැංකියක් සේ ගමන් කරනු ඇත. ඔබේ ගැලවීම රඳා පවත්නේ අප්‍රතිහත අරගලය තුල ම පමනි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරුවන් සමග සටන් සමගියක් ගොඩ නැඟීමෙන් පමනක් ම ජයග්‍රහනය අත් කර ගත හැකි වන්නේ ය. යුහුසුලුවන්න, කම්කරු - කොමියුනිස්ට් වරුනි ඔබට ඉතිරිව ඇත්තේ කෙටි කාලයකි!"[36] 1933 හිට්ලර් බලයට පැමිනීමත් සමග මෙම අනතුරු හැඟවීම ඛේදජනක ලෙස තහවුරු විය. හිට්ලර්, කම්කරු පන්තියේ නායකත්වය අත් අඩංගුවට ගැනීමට හෝ ඝාතනය කිරීමට ද, එම පන්තියේ ස්වාධීන සංවිධාන විනාශ කිරීමට ද පියවර ගති.

57. ජර්මනිය තුල ෆැසිස්ට්වාදයේ ජයග්‍රහනය, කොමියුනිස්ට් පක්ෂවල පිරිහීමේ සන්ධිස්ථානයක් විය. මීට ප්‍රතිචාර වශයෙන් ට්‍රොට්ස්කි, නව ජාත්‍යන්තරයක් ද, නව පක්ෂ ද ගොඩනැඟීම සඳහා කැඳවුම් කලේය. ජර්මනිය තුල කම්කරු පන්තිය පෙර නොවූ විරූ පරාජයන් ට මුහුනපා සිටිය ද, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පක්ෂ ඇතුලතින් ජාත්‍යන්තරයේ පිලිවෙත් කෙරෙහි කිසිඳු විරුද්ධත්වයක් පල නොවීය. "මොස්කව් නායකත්වය, හිට්ලර්ට ජය තහවුරු කර දුන් සිය පිලිවෙත නොවරදින බව ප්‍රකාශ කර සිටියා පමනක් නොව සිදු වූයේ කුමක් දැයි සාකච්ඡා කිරීම

පවා තහනම් කලේ ය.” යයි ට්‍රොට්ස්කි 1933 දී ලිවී ය. “එහෙත් කිසිදු විලිලජ්ජාවකින් තොර වූ මෙම තීන්දුවට විරුද්ධත්වයක් නොවී ය. එය පෙරලා දමනු ලැබුවේ ද නැත. ජාතික සම්මේලන හෝ ජාත්‍යන්තර සම්මේලන පැවැත්වුනේ ද නැත. පක්ෂ රැස්වීම්වල හෝ පුවත්පත්වල සාකච්ඡාවන් ද නොවී ය. ෆැසිස්ට්වාදයේ හෙන හඬ මගින්වත් දෙ ඇස් නොඇරුනු සංවිධානයක මෙවන් තුච්ඡ ක්‍රියාවන්ට යටත්වන්නා වූ නිලධරය එමගින් පෙන්නුම් කර ඇත්තේ එය මලකුනක් බව ය. එය යලි පන ගැන්වීමක් කවර කලෙක වත් කවරෙකුට හෝ කල නොහැකි බවය.”[37] එය කොතරම් දුරදිග යන පිරිහීමකට පත් වී තිබුනත් තව මත් සෝවියට් සංගමය කම්කරු රාජ්‍යයක් යයි ට්‍රොට්ස්කි පෙන්වා දුනි. එහෙයින්ම එය සමාජවාදී පිලිවෙතක් දිගේ වර්ධනය වීම කෙසේ වෙතත්, දිගුකලක් සුරැකී පැවැත් ම පවා රැඳී පැවැත්තේ ස්ටැලින්වාදී නිලධරය දේශපාලන විප්ලවයක් මගින් පෙරලාදැමීම මත බව හෙතෙම පෙන්වා දුන්නේය.

## හතරවන ජාත්‍යන්තරය හා මාධ්‍යමිකවාදයට එරෙහි අරගලය

58. හතරවන ජාත්‍යන්තරය සඳහා කරන ලද කැඳවුම උපායාත්මක පියවරක් නොවී ය. එය සෝවියට් තන්ත්‍රයේ සමාජික හා දේශපාලන ප්‍රතිවර්තනය ද, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ හා කම්කරු පන්තිය සමඟ වූ එහි සම්බන්ධතාවය ද පිලිබඳ තක්සේරුවක් මත පදනම් වූ නිගමනයක් විය. මෙම පියවරේදී, ට්‍රොට්ස්කි විසින් ම නිර්වචනය කල “මාධ්‍යමික” ප්‍රවනතාවන් සමඟ 1930 ගනන්වල මැද්දැවේ ඔහු සට්ටනයකට එලඹුනේ ය. මෙම කන්ඩායම් සමාජවාදී විප්ලවයට සිය කැපවීම ප්‍රකාශ කරන ගමන් ම හතරවන ජාත්‍යන්තරය ගොඩනැගීමට විරුද්ධ වූහ. ඔවුහු ඒ වෙනුවට ස්ටැලින්වාදය සහ ට්‍රොට්ස්කිවාදය අතර ද, ප්‍රතිසංස්කරන හා විප්ලවය අතර ද කිසියම් වර්ගයක අතරමැදි අම්බලමක් සොයා ගන්නට උත්සාහ කල හ.

59. ට්‍රොට්ස්කි 1934 දී මෙම මාධ්‍යමික ප්‍රවනතා තුල පොදුවේ දක්නට ලැබුනු සමහර දේශපාලන හා න්‍යායික ගති ලක්ෂන අනන්‍යකර නම් කලේ ය. “මාධ්‍යමිකයා විප්ලවවාදී මූලධර්ම, එනම්ඃ සැබැවින්ම පවත්නා තතු ප්‍රකාශ කිරීමට වෛර කරයි. ඔහු මූලධර්මාත්මක පිලිවෙතක් වෙනුවට පෞද්ගලික උපාමාරු සහ පටු සංවිධානාත්මක සට කපටකම් යොදා ගැනීමට නැඹුරු වෙයි. යම් ප්‍රමානයකට ධනේශ්වරය හා කම්කරු පන්තිය අතර රැඳී සිටින සුලු ධනේශ්වරයට සමාන්තර වන පරිදි මාධ්‍යමිකයා, අවස්ථාවාදය හා මාක්ස්වාදය අතර පැද්දෙනසුලු ආස්ථානයක් ගනියි. ධනේශ්වරයට දන්ඩ නමස්කාර කරන හෙතෙම කම්කරු පන්තිය කෙරෙහි පිලිකුල දක්වයි.” මාධ්‍යමිකවාදයේ තවත් සාරභූත ලක්ෂනයක් වනුයේ නිවැරදි ජාත්‍යන්තරවාදී පිලිවෙතක හා නැඹුරුවක තීරනාත්මක වැදගත්කම වටහා ගැනීමට එය දක්වන නොසමත් බවයි. ට්‍රොට්ස්කි ලියූ පරිදි මාධ්‍යමිකයා, “වත්මන් යුගයේ දී ජාතික විප්ලවවාදී පක්ෂයක් ගොඩ නැගිය හැකි වන්නේ ජාත්‍යන්තර පක්ෂයක කොටසක් හැටියට පමනක් යයි තේරුම් ගෙන නැත. තම ජාත්‍යන්තර සගයන් තෝරා ගැනීමේ දී මාධ්‍යමිකයා තම රට තුලදීට ද වඩා ජාත්‍යන්තරව නොසැලකිල්ලක් ප්‍රදර්ශනය කරයි.” [38]

60. ෆැසිස්ට්වාදී තර්ජනය හමුවේ, කම්කරු පන්තිය වමට ගමන්කරන විට මාධ්‍යමික කන්ඩායම්, අව්‍යාජ විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමට විරුද්ධ වෙති. බ්‍රිතාන්‍යයේ ඉන්ඩිපෙන්ඩන්ට් ලේබර් පක්ෂය, ජර්මනියෙන් පිටුවහල් වූවන්ගෙන් සමන්විත එස්ඒපී සංවිධානය, පසු කල ද්‍රෝහී භූමිකාවක් ඉටු කල ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයා හා චාන්සලර් ධූරයට පත් විලී බ්‍රාන්ට්, ස්පාඤ්ඤ පූම් (පීඕයූඑම් පක්ෂය) සහ තවත් උදවිය - විප්ලවවාදී දේශපාලනය සහ ප්‍රතිසංස්කරනවාදී දේශපාලනය අතර මැද අම්බලමක් සෙවීමට කැස කැවූහ. හතරවන ජාත්‍යන්තරය ගොඩනැගීම අපරිනත ක්‍රියාවක් බවට ඔවුන්ගේ කියාපෑම් යටින් පැවතුනේ, 1. ස්ටැලින්වාදී තන්ත්‍රය හා ඊට අනුබද්ධ පක්ෂ ප්‍රතිවිප්ලවවාදී යයි ට්‍රොට්ස්කි කල ගුනාංගීකරනය සමග පැවති මූලික විසංවාදයන් හා 2. ඔවුන්ගේ ජාතික වටපිටාව තුල පවත්වාගෙන ගිය අවස්ථාවාදී දේශපාලන සම්බන්ධතාවන් ගෙන් කැඩී වෙන් වීමට දක්වන අකැමැත්තයි.

## මහජන පෙරමුනේ ද්‍රෝහිත්වය

61. සෝවියට් පාලන තන්ත්‍රයේ පිලිවෙත් විවෘත ප්‍රතිවිප්ලවවාදී ස්වභාවයක් අත් කරගත් තතු තුල, මාධ්‍යමික ප්‍රවනතාවල මගහැරීම් හා වැනීම්, ස්ටැලින්වාදයට එරෙහි අරගලයේ දී හරහට පිහිටියේය. ජර්මනියේදී හිට්ලර්ට එරෙහිව ට්‍රොට්ස්කි කැඳවූ, කම්කරු පක්ෂවල “එක්සත් පෙරමුනකට” විරුද්ධ වූ ස්ටැලින්වාදීහු, නාසි ජයග්‍රහනයෙන් පසු අනික් අන්තයට පැද ගියහ. 1935 දී කොමින්ටර්නයේ සත් වන සම්මේලනයේ දී ඔවුහු අලුත් වැඩ පිලිවෙලක්, එනම් “මහජන පෙරමුන”, දොරට වැඩම කලහ. මෙය ෆැසිස්ට්වාදයට එරෙහි අරගලයේ හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ නාමයෙන් “ප්‍රජාතන්ත්‍රවාදී” ධනේශ්වර පක්ෂ සමග දේශපාලන සන්ධාන ගොඩනැගිය යුතු යයි යෝජනා කලේ ය. මෙම සන්ධානවල ප්‍රායෝගික බලපෑම එල්ල වූයේ කම්කරු පන්තිය ධනේශ්වර පන්තියට, පුද්ගලික දේපලවලට හා ධනපති රාජ්‍යයට යටත් කිරීමට ය. කම්කරු පන්තියට දේශපාලනිකව ව්‍යසනකාරී වූ මහජන පෙරමුන, සෝවියට් නිලධරයේ

අවශ්‍යතාවයන්ට සේවය කලේ ය. කම්කරු පන්තියේ විප්ලවවාදී අරගලය පාවාදීමේ උපකරන ලෙස දේශීය කොමියුනිස්ට් පක්ෂ යොදා ගැනීමට ඉඩ හරින අතර ස්ටැලින්. එමගින් ධනේශ්වර පාලන තන්ත්‍රවල අනුග්‍රහය ලබා ගැනීමට ද සෝවියට් සංගමයේ රාජ්‍යතාන්ත්‍රික තත්වය වර්ධනය කර ගැනීමට ද අපේක්ෂා කලේ ය. ඉහත මූලෝපායික පදනම යටතේ කුමන තාවකාලික හා සීමිත රාජ්‍ය තාන්ත්‍රික ජයග්‍රහන දිනා ගත්තත්, "මහජන පෙරමුනුවාදය" තුලින් කම්කරු පන්තියට අත් කර දුන් පරාජයන්, සෝවියට් සංගමය බරපතල ලෙස දුර්වල කර දැමීය.

62. ස්ටැලින්වාදී පිලිවෙත දැනුවත්ව ම යොමු කරන ලද්දේ කම්කරු පන්තිය විප්ලවවාදී ලෙස බලය අල්ලා ගැනීමට එරෙහිව ය. විශේෂයෙන්ම බටහිර යුරෝපයේදී කම්කරු පන්තිය බලය අල්ලා ගත හොත් එය, සෝවියට් කම්කරු පන්තියේ විප්ලවවාදී ව්‍යාපාරය යලි පනගන්වනු ඇතැයි ස්ටැලින් භීතියට පත් විය. 1936-38 අතර කාලයේ දී ස්ටැලින්වාදියෝ, 1936 ජූනි මාසයේ ප්‍රන්සයේ මහා වැඩ වර්ජනයක් පැනනැඟී තිබුනු තත්වයේ දී, විප්ලවවාදී වාතාවරනයේ ගෙල හිරකර දැමූහ. ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ ද සහයෝගය ඇතිව මහජන පෙරමුනු තන්ත්‍රය විසින්, කම්කරු පන්තිය පක්ෂඝාත කරමින් 1940 ජූනි මාසයේදී ප්‍රන්ස ධනේශ්වරය හිට්ලර්ට යටත්කර දීම පිනිස මඟ හෙලි කලේය. ස්පාඤ්ඤ විප්ලවයේ දී ස්ටැලින්වාදීහු අසානාගේ ධනේශ්වර ආන්ඩුවට සහාය දුන්හ. ස්පාඤ්ඤ කොමියුනිස්ට් පක්ෂය ධනේශ්වර දේපල ක්‍රමයේ හා පාලනයේ ප්‍රධානම මුක්කුව බවට පත් විය. සමාජවාදී විප්ලවය කෙරෙහි මංමුලා සහගත බියකින් පෙලුනු වරප්‍රසාදිත නාගරික මධ්‍යම පන්තික කොටස් විශාල වශයෙන් එයට බඳවාගන්නා ලදී. සමාජවාදී ප්‍රවනතාවන්ට එරෙහි ප්‍රචන්ඩත්වය මුදාහල ජීපීයූ ඒජන්තයන් ස්ටැලින් විසින් ස්පාඤ්ඤය වෙත තොග පිටින් පිටත්කර එවීය. ඔහුගේ ඒජන්තයෝ බාර්සිලෝනාවේ කම්කරු පන්ති නැඟිටීම මැඩ පැවැත්වීමට ක්‍රියාකල අතර, (පීඕයූඑම්) පූම් පක්ෂ නායක නින් පැහැරගෙන ගොස් වධ දී මරා දැමූහ. ස්ටැලින්වාදීන්ට 'පූම'ය මර්දනය කිරීමට හැකියාව ලැබුනේ, නින්ගේ ම බේදනීය මාධ්‍යමික පිලිවෙත් නිසා ය. ඔහු බාර්සිලෝනාවේ මහජන පෙරමුනු ආන්ඩුවට ඇතුල්වී සිටියේය. එක්සත් ජනපදයේ කොමියුනිස්ට් පක්ෂය ඩිමොක්‍රැටික් පක්ෂයට ද ෆ්‍රැන්ක්ලින් ඩිලානෝ රූස්වෙල්ට් ට ද සහාය දුන්හ.

63. ධනේශ්වර ලිබරල්වාදය සහ ජීපීයූව (සෝවියට් රහස් පොලීසිය) අතර සන්ධානය ලෙස ට්‍රොට්ස්කි විසින් නිර්වචනය කරන ලද මහජන පෙරමුනුවාදයේ දේශපාලන සාරය වූයේ සමාජවාදී විප්ලවයේ අනතුරෙන් ධනේශ්වර දේපල රැක ගැනීම ය. එය "ප්‍රජාතන්ත්‍රවාදය" ගැන කල වාචාල වග වර්නනා යොදා ගැනුනේ කම්කරු පන්තිය දේශපාලනිකව නිරායුධ කොට, එහි දේශපාලන ස්වාධීනත්වය අහෝසි කර දමා, "ප්‍රජාතන්ත්‍රවාදී" රාජ්‍යයේ පන්ති අන්තර්ගතය වහංගු කිරීමට ය. කම්කරු පන්තිය ස්වාධීනව තම දේශපාලන බලය සඳහා සටන් කිරීමෙන් වලකා ලූ මහජන පෙරමුනු උපාය, ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වූ සැබෑ ප්‍රහාරවලට එරෙහි කම්කරු පන්තියේ සටන්වල ගෙල හිර කලේ මාරක ප්‍රතිවිපාක ගෙන දෙමිනි. ප්‍රන්සයේ දී හා ස්පාඤ්ඤයේ දී විදහා දැක්වුනු පරිදි, සමාජවාදය සඳහා සටනින් තොරව, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමේ උපායන් බංකොලොත් වූවාක් මෙන්ම, ව්‍යසනයකින් කෙලවර විය. ප්‍රන්සයේ දී මෙන්ම ස්පාඤ්ඤයේ දී ද නිතර මතු කරන ලද ස්ටැලින්වාදී තර්කවලින් එකක් වූයේ විප්ලවවාදී පිලිවෙත්, සුලු ධනේශ්වරය "බියපත් කොට" ඔවුන් ෆැසිස්ට්වාදීන්ගේ ඔඩොක්කුවට තල්ලු කර දමනු ඇත යන්න ය. මේ අනුව නම්, කම්කරු පන්තියට මධ්‍යම පන්තියේ සහාය දිනා ගත හැක්කේ, පුද්ගලික දේපලට තර්ජනය කල සමාජවාදී ඉල්ලීම් අතහැර දැමීම මගින් ද, මහජන පෙරමුනු රාමුව තුල ධනේශ්වර පන්තියේ මධ්‍යස්ථ නායකයන්ට සහාය දීමෙන් ද වේ. මධ්‍යම පන්තිවල සමාජ මනෝ විද්‍යාව මුලුමනින්ම අතහැර දැමීමක් නියෝජනය කල මෙම බියගුලු පරාජකවාදී ප්‍රවිෂ්ටය ට්‍රොට්ස්කි දැඩි සේ ප්‍රතික්ෂේප කලේ මෙසේයඃ

> වත්මන් සුලු ධනේශ්වරය "ආන්තික පියවරයන්" කෙරෙහි දක්වන බිය නිසා කම්කරු පන්තිය වෙතට නොයනු ඇතැයි අවධාරනය කිරීම වැරදිය, තෙවරක්ම වැරදිය. ඊට සපුරාම වෙනස් ලෙස, සුලු ධනේශ්වරයේ ඉමහත් බහුතරය වන එහි පහල තට්ටු කම්කරු පන්තික පක්ෂ දැක ගන්නේ පාර්ලිමේන්තු උපකරන ලෙස පමනි. ඔවුන් ඒවායේ ශක්තිය ගැන විශ්වාස නොකරති. අරගලයේ දී ඔවුන්ගේ ධාරිතාවය ද, මේ අවස්ථාවේ දී අරගලය අවසානය දක්වා ම ගෙන යාමෙහි ලා ඔවුන්ගේ සූදානම ගැන ද එම කොටස් තුල විශ්වාසයක් ඇත්තේ නැත.
>
> --තත්වය මෙසේ නම් රැඩිකල්වාදය (ධනේශ්වරයේ "වාම" දේශපාලන ප්‍රවනතාවය) වෙනුවට ඔවුන්ගේ වාම පාර්ලිමේන්තු මිත්‍රයන් තෝරා ගැනීමෙන් ඇති පලය කුමක් ද? බාගෙට-අසන්තක, නට්ටම්, හා අතෘප්තියට පත් දේපල හිමියා හිතන්නේ හෝ යුක්ති සහගත කර ගන්නේ ඒ ආකාරයට ය. ගොවියන්, ශිල්පීන්, සේවකයන් වැනි සුලු වෘත්තිකයන්ගේ මෙම මනෝගතිය - එය ගලා එන්නේ සමාජ අර්බුදය තුලිනි- අවබෝධ කර ගැනීමකින් තොරව, නිවැරදි පිලිවෙතක්

විස්තාරනය කල නොහැකි ය. සුලු ධනේශ්වරය ආර්ථික වශයෙන් පරාධීනය, දේශපාලනිකව කුඩු පට්ටම් වී ගොසින්ය. එම පන්තියට ස්වාධීන පිලිවෙතක් ගෙනයා ගත නොහැක්කේ එබැවින් ය. ඔවුන්ට තමන් ධෛර්යමත් කොට නගා සිටුවිය හැකි "නායකයකු" අවශ්‍යය. මෙම පුද්ගලයා හෝ සාමූහික නායකත්වය, එනම් මහා පුද්ගලයෙකු හෝ පක්ෂයක්, එම පන්තියට ලබාගත හැක්කේ මූලික පන්ති දෙකින් එකකිනිඃ එක්කෝ ධනපති පන්තියෙනි, නැතහොත් කම්කරු පන්තියෙනි. ෆැසිස්ට්වාදය විසිරී ගිය ජනකාය ඒකාබද්ධ කොට සන්නද්ධ කරයි. එය මනුෂ්‍ය ධූලි තුලින් සටන් බලකායන් සංවිධානය කරයි. එය තමන් ස්වාධීන බලවේගයක් ය යන මිථ්‍යාව සුලු ධනේශ්වරයට අත් කර දෙයි. තමන්ට රාජ්‍යය මත ආධිපත්‍යය දැරිය හැකි යයි පරිකල්පනය කිරීමට සුලු ධනේශ්වරය පටන් ගනියි. මෙම මිථ්‍යාවන් හා බලාපොරොත්තු සුලු ධනේශ්වරයේ හිස්ගෙඩි නටවන්නට පටන් ගැනීම පුදුමයක් නොවේ!

එහෙත් සුලු ධනේශ්වරයට කම්කරු පන්තියෙන් ද නායකයෙක් සොයා ගත හැකි ය.[39]

64. කොමින්ටර්නය සෝවියට් නිලධරයේ උපකරනයක් බවට ප්‍රතිවර්තනය කරනු ලැබුවේ විරේකයන් හා පන්නා දැමීම් මාලාවක් තුලිනි. විප්ලවවාදී ජාත්‍යන්තරවාදයේ සම්ප්‍රදායයන් නියෝජනය කලා වූ නායකයන් සියලු දෙනා ඉවත් කර දමන ලද අතර ඔවුන් වෙනුවට නිලධර තන්ත්‍රයේ එහෙයියන් පත් කරන ලදී. 1923 ඇරැඹුනු මෙම ප්‍රතිවර්තනය 1930 ගනන් පුරාම කරගෙන යන ලදී. ඒ, බොහෝ විට ට්‍රොට්ස්කිවාදයට එරෙහි අරගලයේ කොටසක් ලෙස ය. මහජන පෙරමුනේ කාල පරිච්ඡේදය එලැඹෙන විට කොමින්ටර්නය, ලෝක විප්ලවය පිලිබඳ ක්‍රියාමාර්ගය මුලුමනින් ම පිටු දැක තිබුනි. ස්ටැලින් එය "ඛේදජනක හා විහිලුසහගත වැරදි වැටහීමක්" යයි නම් කර තිබුනි. ස්ටැලින්වාදී නිලධරයේ අධිරාජ්‍යවාදී සගයන්ට ඉඟි පෑමක් ලෙස 1943 දී කොමින්ටර්නය විසිරුවා හරින ලදී.

## විප්ලවය පාවාදෙයි

65. හතරවන ජාත්‍යන්තරය සඳහා අරගලය අභිප්‍රේරනය කල සමාජ-ආර්ථික අවශ්‍යතා, 1936 දී ට්‍රොට්ස්කි ලිවූ *විප්ලවය පාවාදෙයි* කෘතිය මඟින් විස්තාරනය කරන ලදී. සෝවියට් නිලධරයේ පැන නැඟීම, වර්ධනය හා නො වැලැක්විය හැකි විනාශය පාලනය කරන නීති හෙලිදරව් කල ට්‍රොට්ස්කි, ඓතිහාසිකව කුමන හෝ ප්‍රගතිශීලී කාර්ය භාරයක් එයට පවරා දීම ප්‍රතික්ෂේප කලේ ය. කම්කරු රාජ්‍යයක් තුල වරප්‍රසාදිත කුලයක් ලෙස නිලධරයේ පැවැත්ම පාලනය කරන ප්‍රති විරෝධයන් විශ්ලේෂනය කරමින් ට්‍රොට්ස්කි තහවුරු කලේ, 1917 ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහන ආරක්ෂා කර පෙරට ගෙන යා හැක්කේ, බොල්ශෙවික් විප්ලවයෙන් සාක්ෂාත් කල ජනසතු දේපල සම්බන්ධතා තිරසාර කර වර්ධනය කරන අතර, දේශපාලන විප්ලවයක ස්වරූපය ගත් ප්‍රචන්ඩ පෙරලියක් මඟින් නිලධරය පෙරලා දැමීම හරහා පමනක් බවයි. ලෝක විප්ලවය මත එහි ඉරනම රඳා ඇති සෝවියට් තන්ත්‍රය සංක්‍රමනික දෙයක් ලෙස ට්‍රොට්ස්කි අර්ථ දැක්වීය. ට්‍රොට්ස්කි මෙසේ ලිවීයඃ

> සෝසසසං අඩක් ධනවාදී හා අඩක් සමාජවාදී වූ ප්‍රතිවිරෝධී සමාජයකි. එහි, 1. රාජ්‍ය දේපල සඳහා සමාජවාදී ස්වරූපයක් ගෙන දීමට නොසෑහෙන තරම් නිෂ්පාදන බලවේග නොදියුනුය. 2. සැලසුම්ගත ආර්ථිකයේ නා නා ප්‍රකාර සිදුරු තුලින්, ගැලවී යාමේ අවශ්‍යතාවෙන් නිර්මිත ප්‍රාථමික රාශීකරනයක් දෙසට වන ප්‍රවනතාවය. 3. සමාජයේ නව අනන්‍යතාවයෙහි පදනමේ රැඳී ඇති බෙදාහැරීමේ සම්මතයන්, ධනේශ්වර ස්වභාවයක් රැකගෙන තිබීම. 4. පීඩිතයන්ගේ තත්වය ක්‍රමයෙන් නරක අතට හරවමින්, වරප්‍රසාදිත ස්ථරයකගේ ක්ෂනික හැඩගැස්මක් දිරිමත් කරන ආර්ථික වර්ධනය. 5. සමාජ ප්‍රතිසතිතාවන් ගසාකමින් නිලධරය, සමාජවාදයට පිටස්තර වූ ද පාලනය කල නොහැකි වූ ද කුලයක් බවට පරිවර්තනය වීම. 6. පාලක පක්ෂය විසින් පාවාදෙන ලද සමාජ විප්ලවය, දේපල සම්බන්ධතාවන්හි හා පීඩිත ජනතාවගේ විඥානය තුල තවමත් ඉතිරිව තිබීම. 7. සමුච්චිත ප්‍රතිවිරෝධයන්ගේ තවදුර වර්ධනයක් සමාජවාදය ධනවාදයේ පිටුපසට ගමන් කරවනු ඇත. 8. ධනවාදය කරා මාවතේ දී ප්‍රතිවිප්ලවය කම්කරුවන්ගේ ප්‍රතිරෝධය බිඳ දමනු ඇත. 9. සමාජවාදය කරා මාවතේ දී කම්කරුවන් නිලධරය පෙරලා දැමිය යුතුය. අවසාන විග්‍රහයේ දී ප්‍රශ්නය තීරනය වනු ඇත්තේ ජාතික හා ලෝක කරලිය යන දෙකෙහි ම ජීවමාන බලවේගයන් ගේ අරගලයක් මඟිනි. [40]

66. සෝවියට් සමාජය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය කෙරෙහි දැක්වෙන විරුද්ධත්වය වනාහි, නිලධරය නව පාලක පන්තියක් නියෝජනය කරන්නේය යන, "රාජ්‍ය ධනවාදය" ලෙස පොදුවේ දන්නා න්‍යාය සමඟ පෙල ගැසීමයි. නිලධරය පන්තියක්

ලෙස අංග ලක්ෂනය කිරීම සඳහා මාක්ස්වාදී යුක්ති සහගත භාවයක් සම්පාදනය කිරීමට, සියලු හැඩතල සහිතව වුවත්, එය අසමත් විය. මාක්ස්වාදයට අනුව පන්තියක් හඳුනා ගන්නේ සමාජයේ ආර්ථික ව්‍යුහය තුල එයට ම විශේෂිත වූ මූලයන් අනුව ය. පන්තියක පැවැත්ම ඓතිහාසිකව සුවිශේෂිවූ දේපල රූපාකාරයන් හා නිෂ්පාදන සම්බන්ධතාවන් සමඟ බැඳී ඇති අතර, ඒවා අනෙක් අතට මෙම සමාජ ස්ථරයේ ක්‍රියාකාරිත්වය තුල මූර්තිමත් වේ. සෝවියට් නිලධරය එවන් ඓතිහාසික බලවේගයක් නියෝජනය නොකලේ ය. නිලධරය දේශපාලන බලය පැහැර ගත්තේය, එය රාජ්‍යය පරිපාලනය කලේය, එය සෝවියට් සංගමයේ ධනයෙන් සැලකිය යුතු පංගුවක් ගිල දැමීය. එහෙත් දේපල ආකෘතීන් පැන නැංගේ කම්කරු පන්තියේ විප්ලවයකිනි. ට්‍රොට්ස්කි, නිලධරය විසින් රාජ්‍යය මත යොදන ලද ඉමහත් දේශපාලන බලය ප්‍රතික්ෂේප නොකලේ ය. "නිලධරය හා ජාතියේ වස්තු සම්භාරය අතර, අලුත් හා එබැවින්ම නොදන්නා වූ සම්බන්ධයක්"[41] නිර්මානය කර තිබේ. දේශපාලන විප්ලවයක් මඟින් පූර්වභංග නොකලහොත්, මෙය තුඩු දෙනු ඇත්තේ "නිර්ධන පන්ති විප්ලවයෙන් අත්කර ගත් සමාජ ජයග්‍රහන සහමුලින්ම ඈවර කර දැමීමට" යයි ට්‍රොට්ස්කි අනතුරු ඇඟවීය.[42] විප්ලවය පාවාදෙයි, ප්‍රකාශයට පත් කර වසර 55 ක ඇවෑමෙන් හරියටම සිදුව ඇත්තේ මෙයයි. කෙසේ වුව ද, නිලධරය පන්තියකට වඩා කුලයක් බවට කල ට්‍රොට්ස්කිගේ අර්ථ කථනය පිලිබඳ තීරනාත්මක සනාථනයක්, සෝවියට් සංගමය විසුරුවා හැරීමේ ප්‍රතිවිපාකයන් මඟින් සම්පාදනය කර තිබේ. සෝවියට් සංගමයේ විනාශය ඉක්මනින්ම තුඩුදුන්නේ රාජ්‍ය දේපල ඈවර කිරීමට හා ඒවා පෞද්ගලික දේපල බවට හැරවීමට ය. ඉහල තැන්වල වැජඹුනු නිලධරයන්, තමන් කලින් පරිපාලනය කල රජය සතු කාර්මික, මූල්‍ය හා ස්වාභාවික සම්පත් සිය පෞද්ගලික දේපල බවට පත්කර ගත්හ. හොරා ගැනීම මඟින් මුලුමනින්ම පාහේ තමා සන්තක කර ගත් රාජ්‍ය දේපල, සිය අඹු දරුවන්ට පැවරීමට මෙම නව ධනේශ්වරයට ඉඩ සැලසමින්, හිමිකම් නීති සම්පාදනය කරන ලදී. කොටස් හුවමාරු මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. වටිනාකම පිලිබඳ නීතිය මඟින් හසුරුවනු ලබන වෙලඳ භාන්ඩයක් බවට ශ්‍රමය පත්කරන ලදී රාජ්‍ය සැලසුම්කරනයේ ඉතිරි පහදු බිඳ වැටුනි. නිලධරය සුවිශේෂ පන්තියක් ලෙස නීත්‍යානුකූලව හඳුනාගත හැකිව තිබූ එකදු විශේෂ සමාජ ගුනාංගයක් මඟින් හෝ සෝවියට් සංගමය ර කුනේ නැත. සෝවියට් සංගමය තුල පැවතියේ "රාජ්‍ය ධනවාදය" නම් එය, කම්කරු රාජ්‍යයත් සමඟම වේගයෙන් අතුරුදහන් විය! රාජ්‍ය ධනවාදය පිලිබඳ " න්‍යාය," සෝවියට් සමාජය පිලිබඳව හෝ ස්ටැලින්වාදයට එරෙහි විප්ලවවාදී අරගලය සඳහා දේශපාලන මූලෝපායක් පිලිබඳව හෝ කිසිදු සමාජ විද්‍යාත්මක වැටහීමක් ඇතිකරන්නේ නැත.

67. ස්ටැලින්වාදී නිලධරය ඔක්තෝබර් විප්ලවයේ සමස්ත නායකත්වයම පාහේ ඝාතනය කලේ ය. සිනොවියෙව්, කමනෙව්, බුකාරින් හා රකොව්ස්කි ඇතුලු බොල්ශෙවික් නායකයන්ට එරෙහිව, 1936 - 1938 අතර කාලයේ හොර නඩු අටවන ලදී. මෙම ගොරතර ක්‍රියාවලිය තුල විත්තිකරුවන්ට තමාව ම හෙලාදැකීමට බලකරන ලද්දේ, තමන් ද තම පවුලේ සාමාජිකයන් ද බේරාගැනීමට එම පාපෝච්චාරන මඟින් ඉඩ සැලසෙන්නේය යන බොරු පොරොන්දු ලබාදෙමිනි. නඩු විභාග අවසන් වූයේ නියත ලෙස ම පැය කිහිපයක් තුල ක්‍රියාවට නැඟූ මරන දන්ඩනය පැනවීමෙනි. රකොව්ස්කි හා රඩෙක් සම්බන්ධ කාරනවේදී මෙන් අවස්ථා කිහිපයක දී චූදිතයන්ට සිර දඬුවම් පමුනුවන ලද නමුත් පසුව ඔවුන් රහසිගතව මරාදමන ලදී. මහජනතාවගේ ඇස නොගැසීමට වග බලාගත්, පෙර නොවූ විරූ පරිදි ගෙන ගිය ජන ඝාතන ව්‍යාපාරයක ප්‍රසිද්ධ පිලිබිඹුව, මෙම නඩු විභාගයි. දේශපාලන පරම්පරා ගනනාවක මාක්ස්වාදී බුද්ධිමතුන් හා කම්කරුවන්ගේ හොඳම නියෝජිතයන් වූ සමාජවාදීන්, ලක්ෂ ගනනක් කායිකව ඝාතනය කෙරුනි. ෆැසිස්ට් ආඥාදායක මුසෝලිනී ප්‍රශංසාත්මකව සඳහන් කලේ, ස්ටැලින්ගේ තන්ත්‍රය තම තන්ත්‍රයට වඩා වැඩි සංඛ්‍යාවක් කොමියුනිස්ට්වාදීන් මරාදැමූ බවයි. 1936-39 අතර කාලයේ ප්‍රතිවිප්ලවවාදී රැල්ලකින් මිලියනයකට ආසන්න මිනිසුන් මරාදැමුනි. මෙම දියකර හැරීම "විප්ලවයේ මිනී වල හාරන්නා" ලෙස ස්ටැලින් පිලිබඳව ට්‍රොට්ස්කි කල තක්සේරුව විෂද ලෙස සනාථ කලේ, සෝවියට් සංගමයට යලි කවර කලෙක වත් ගොඩ ඒමට නොහැකිවූ පරිදි, සෝවියට් කම්කරු පන්තියේ විප්ලවවාදී විඥානයට ප්‍රහාරයක් එල්ල කරමිනි. මෙම අසාමාන්‍ය අපරාධයන්ගේ ඉතිහාසය හා වාර්තාව, ට්‍රොට්ස්කිවාදය හා ස්ටැලින්වාදය වනාහි හුදෙක් මාක්ස්වාදය නමැති එකම කාසියේ දෙපැත්ත යන කියාපෑම කෙසේ වෙතත්, ස්ටැලින්වාදයම පදනම් වූයේ මාක්ස්වාදයේ න්‍යායික හා දේශපාලන උරුමය මත බවට පලවූ ගනන් නැති ධනේශ්වර ප්‍රචාරකයන්ගේ කියාපෑම් ද, කට උත්තර නැති ලෙස නිෂ්ප්‍රභා කිරීමකි. ට්‍රොට්ස්කිවාදය හා ස්ටැලින්වාදය අතර යථා සම්බන්ධය හොඳින්ම පැහැදිලි කලේ ට්‍රොට්ස්කි විසින් ම ය. ඒ දෙක වෙන් කලේ "ලේ ගංගාවකින්" යයි ඔහු ලීවේය.

## හතරවන ජාත්‍යන්තරය පිහිටුවීම

68. හතරවන ජාත්‍යන්තරය සිය ආරම්භක සමුලුව 1938 සැප්තැම්බරයේ දී පැවැත්වූ අතර, එය ජාත්‍යන්තර කම්කරු පන්තියටත,' සමාජවාදී ව්‍යාපාරයටත්, ඓතිහාසික සැතපුම් කනුවක් විය. *ධනවාදයේ මරලතෝනිය හා හතරවන ජාත්‍යන්තරයේ*

කර්තව්‍යයෝ (බලය අල්ලා ගැනීමට සූදානම් වීම සඳහා ජනතාව සංක්‍රමන ඉල්ලීම් වටා බලමුලු ගැන්වීම) යන එහි ආරම්භක ලියවිල්ල, ට්‍රොට්ස්කි විසින් රචනා කල අතර, සමාජවාදී ව්‍යාපාරය හමුවේ ඇති ප්‍රධාන කාර්ය භාරය එහි ගෙනහැර දැක්වෙයි.

> යටත් පිරිසෙයින් මීලඟ ඓතිහාසික යුගයේ දී, සමාජවාදී විප්ලවයක් නො සිදු වුව හොත්, මානව වර්ගයාගේ මුලු මහත් සංස්කෘතියට ම මහා විනාශයක් එල්ල වන්නේ ය. දැන් වාරය නිර්ධන පන්තියට යි; එනම්, ප්‍රධාන වශයෙන් ම එහි විප්ලවවාදී පෙර ඇනියට යි. මානව වර්ගයාගේ ඓතිහාසික අර්බුදය විප්ලවවාදී නායකත්වයේ අර්බුදය බවට සිඳී ඇත්තේ ය. [43]

69. නායකත්වය පිලිබඳ මෙම අර්බුදයෙන් ගොඩ ඒමට ඇති එකම මාවත වැටී ඇත්තේ, සෑම රටක ම හතරවන ජාත්‍යන්තරයේ ශාඛාවන් ගොඩ නැඟීම හරහා ය. නව ජාත්‍යන්තරයක් ගොඩ නැඟීමට කාලය එලඹ නැතැයි ද එවැන්නක් පැන නැඟිය හැක්කේ "දැවැන්ත සිදුවීම්" තුලින් යයි ද තර්ක කල සංශයවාදීන්ට හා මාධ්‍යමිකවාදීන්ට එරෙහිව, ට්‍රොට්ස්කි මෙසේ පිලිතුරු දුන්නේය.

> හතර වන ජාත්‍යන්තරය දැනට මත් දැවැන්ත සිදුවීම් තුලින් මතු වී ඇවිත් ඇතඃ එනම්, ඉතිහාසයේ සිදු වූ නිර්ධන පන්තියේ දැවැන්ත ම පරාජයන් තුලිනි. මෙම පරාජයන්ට හේතුව දැකිය හැක්කේ ජරපත් නායකත්වයේ පරාභවයෙහි හා ද්‍රෝහිත්වයෙහි ය. පන්ති අරගලය බාධාකිරීම් ඉවසන්නේ නැත. දෙවෙනි ජාත්‍යන්තරයට පසුව තුන් වැනි ජාත්‍යන්තරය, විප්ලවයේ අරමුනු සඳහා මිය ගොස් ඇත. හතර වන ජාත්‍යන්තරය චිරාත් කාලයක් දිනේවා!
>
> එහෙත් එහි නිර්මානය නිවේදනය කිරීම සඳහා තව මත් කාලය එලඹී ඇද්ද? සංශයවාදීහු නිශ්ශබ්ද නො වෙති. හතරවන ජාත්‍යන්තරයට "නිවේදනය" කරනු ලැබීමේ උවමනාවක් නැතැයි අපි මීට පිලිතුරු දෙමු. එය පවතී. එය සටන් කරයි. එය දුබල ද? ඔව්, එහි අනුගාමිකත්වය බහුල නැත. එය තවමත් බාල වියේ පසු වන හෙයිනි. එහි අනුගාමිත්වය තව මත් ප්‍රධාන වශයෙන් ම කේඩරයන් ය. එහෙත් මේ කේඩර යනු, අනාගතය සඳහා ප්‍රතිඥා ය. මෙම කේඩරයන්ගෙන් පිටත, මෙම ග්‍රහ ලෝකය මත විප්ලවවාදී යන නමට සැබැවින් ම උචිත වන එක ද විප්ලවවාදී දහරාවක් වත් ඇත්තේ නැත. [44]

70. 20 වන සියවසේ පසුකාලීන ඉතිහාසය, එකම අව්‍යාජ විප්ලවවාදී නායකත්වය ලෙස පෙනී සිටින්නේ හතරවන ජාත්‍යන්තරය පමනක්ය යන එහි තක්සේරුවේ නිරවද්‍යතාවය, සනාථ කලේ ය. එම අවධියෙහි මූලෝපායික කර්තව්‍ය වූයේ, වෛෂයික විප්ලවවාදී කොන්දේසිවල පරිනත භාවය හා කම්කරු පන්තියේත්, එහි පෙරටු බලඇනියේත් අපරිනත භාවය අතර පරතරය පියවීමයි. මෙම අභියෝගය හමුවේ හතරවන ජාත්‍යන්තරය කම්කරු පන්තියේ විප්ලවවාදී විඥානය නගා සිටුවීම හා එහි පැරනි නායකත්වය හෙලිදරව් කිරීම සඳහා, වැඩ කාලය හා වැටුප් අතර අඩු හා වැඩි වීමක් ද, කර්මාන්ත, බැංකු හා කෘෂිකර්මය ජනසතු කිරීම, කම්කරු පන්තිය සන්නද්ධ කිරීම හා කම්කරු ගොවි ආන්ඩු පිහිටුවීම වැනි ආර්ථික හා දේශපාලන ඉල්ලීම් මාලාවක් සූත්‍රගත කලේ ය. "කම්කරු පන්තියේ පලල් ස්තරවල අද්‍යතන කොන්දේසිවලින් ද අද්‍යතන විඥානයෙන් ද ගලා එන්නා වූත් නිර්ධන පන්තිය විසින් බලය දිනා ගැනීම නමැති ඒකායන අවසාන නිගමනය අප්‍රතිවර්තනීය ලෙස ගමන් ගන්නා වූත් සංක්‍රමන ඉල්ලීම් පද්ධතියක් මේ පාලමටඇතුලත් විය යුතු"[45] බව ට්‍රොට්ස්කි ලිවීය. ඉන් පසු වසරවල දී සංශෝධනවාදී ප්‍රවනතාවන්, හුදෙකලා ඉල්ලීම්, ඒවායේ විප්ලවවාදී අන්තර්ගතයෙන් උගුලුවා ගෙන සමාජවාදී ඉදිරි දර්ශනයක් හා ක්‍රියා මාර්ගයක් සඳහා කම්කරු පන්තිය දිනා ගැනීමේ අරගලයට ආදේශකයක් ලෙස, ඒවා යොදාගැනීම මගින්, අවස්ථාවාදී අනුගතවීම් සඳහා වට්ටෝරු පොතක් බවට සංක්‍රමන ක්‍රියාමාර්ගය පත් කර ගැනීමට උත්සාහ කලේය. මේ ක්‍රමයෙන් ඔවුන් සංක්‍රමන ක්‍රියාමාර්ගයේ කැබලි, කම්කරු පන්තියේ පසුගාමී විඥානයට හා පැරනි ප්‍රතිසංස්කරනවාදී හා ස්ටැලින්වාදී නායකත්වයන්ට එරෙහිව සටන් වැදීමට වඩා, ඒවාට අනුගතවීමේ මාධ්‍යයන් ලෙස යොදා ගැනීමට උත්සාහ කලහ.

71. 1938 මැයි මාසයේ දී ඇමරිකානු ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායකයන් සමඟ ට්‍රොට්ස්කි පැවැත්වූ සාකච්ඡාවල දී ඔහු අවධාරනය කලේ, විප්ලවවාදී පක්ෂයේ ක්‍රියාමාර්ගය සිය අරම්භක ලක්ෂ්‍යය ලෙස ගත යුත්තේ ලෝක ධනවාදී අර්බුදයේ වෛෂයික වර්ධනය මිස, කම්කරු පන්ති විඥානයේ පවත්නා මට්ටම හා ආත්මීය මනෝ භාවයන් නොවන බවය. "ක්‍රියාමාර්ගය කම්කරුවන්ගේ පසුගාමිත්වයට වඩා කම්කරු පන්තියේ වෛෂයික කර්තව්‍යයන් ප්‍රකාශයට පත්කල යුතුය. එය කම්කරු පන්තියේ පසුගාමිත්වය නොව සමාජය පවත්නා ආකාරයට පිලිබිඹු කල යුතුය. එය පසුගාමිත්වය ජය ගැනීමේ උපකරනයකි. මුල් පෙලෙහි ම එක්සත් ජනපදය ද ඇතුලු ධනේශ්වර සමාජයේ සමාජ අර්බුදයෙහි තීව්‍රත්වය, අප අපගේ ක්‍රියාමාර්ගය තුල ප්‍රකාශ කරන්නේ එබැවින් ය. අප මත රඳා නොපවතින වෛෂයික කොන්දේසි, කල්

දැමීමට හෝ නවීකරනය කිරීමට අපට නොපුලුවන. ජනතාව අර්බුදය විසඳනු ඇතැයි අපට සහතික විය නොහැක. එහෙත් අප තත්වය ඒ සැටියෙන් ප්‍රකාශයට පත්කල යුතුය. ක්‍රියාමාර්ගයේ කටයුත්ත එයයි.” ඔහු අවධාරනය කලේය. [46]

## මතු සම්බන්ධයි.

## සටහන්

[30] *"The Chinese Revolution and the Theses of Comrade Stalin,"* චීන විප්ලවය සහ ස්ටැලින් සහෝදරයාගේ තීසීස, *Leon Trotsky on China:* ලියොන් ට්‍රොට්ස්කි චීනය පිලිබඳව (නිව් යෝර්ක්: පාත්ෆයින්ඩර්, 1976) පි.176-77.

[31] ලියොන් ට්‍රොට්ස්කි: නොනවතින විප්ලවය, *The Permanent Revolution* (නිව් පාර්ක් පබ්ලිකේෂන්ස්, ලන්ඩන්, 1971) 22 පිටුව.

[32] එම පි. 105. ජේම්ස් පී කැනන්, එක්සත් ජනපදය තුල වාම විපාර්ශවය 1928-31, (නිව් යෝර්ක්: මෝනාර්ඩ් ප්‍රෙස්, 1981), 32 පි.

[33] ජේම්ස් පී කැනන්, *The Left Opposition in the United States 1928-31,* එක්සත් ජනපදය තුල වාම විපාර්ශවය 1928-31, (නිව් යෝර්ක්: මෝනාර්ඩ් ප්‍රෙස්, 1981), 32 පි.

[34] ලියොන් ට්‍රොට්ස්කි, *The Third International After Lenin,* ලෙනින්ගෙන් පසු තුන්වන ජාත්‍යන්තරය (නිව්යෝර්ක් පාත්ෆයින්ඩර්, 2002). පි. 28-29.

[35]. "The ‘Third Period’ of the Comintern’s Errors," in: *Writings of Leon Trotsky 1930,*" කොමින්ටර්නයේ වැරදිවල "තුන් වන" කාල පරිච්ඡේදය", ට්‍රොට්ස්කිගේ ලේඛන 1930. පි. 28.

[36] . "For a Workers’ United Front Against Fascism" in *The Struggle Against Fascism in Germany* ජර්මනියේ තුල ෆැසිස්ට්වාදයට එරෙහි අරගලය ග්‍රන්ථයේ ෆැසිස්ට්වාදයට එරෙහි කම්කරුවන්ගේ එක්සත් පෙරමුනක් සඳහා ලිපිය (නිව් යෝර්ක් පාත්ෆයින්ඩර් ප්‍රෙස්, 1971), පිටු 141.

[37] . "It is Necessary to Build Communist Parties and an International Anew" in *The Struggle Against Fascism in Germany* "කොමියුනිස්ට් පක්ෂ හා ජාත්‍යන්තරයක් අලුතින් ගොඩ නැගීම අවශ්‍යය.” එම. පි 420.

[38] "Centrism and the Fourth International," in: *Writings of Leon Trotsky 1933-34,*" මාධ්‍යමිකවාදය සහ හතර වන ජාත්‍යන්තරය _" ට්‍රොට්ස්කි ලේඛන 1933-34. (නිව් යෝර්ක්: පාත්ෆයින්ඩර්, 1988) පි. 233.

[39] ලියොන් ට්‍රොට්ස්කි, *Whither France,* ප්‍රන්සය කොයිබට ද (ලන්ඩන්: නිව් පාර්ක් පබ්ලිකේෂන්ස්, 1974), පි. 13.

[40] .ලියොන් ට්‍රොට්ස්කි, *The Revolution Betrayed: What Is the Soviet Union and Where Is It Going?,* පාවා දුන් විප්ලවය, සෝවියට් සංගමය යනු කුමක් ද? එය කොතැනට ද? 1991 ඩෙට්රොයිට් කම්කරු ප්‍රකාශන, 216 පිටුව.

[41] එම පි. 211.

[42] එම.

[43] *ධනවාදයේ මර ලතෝනිය හා හතරවන ජාත්‍යන්තරයේ කර්තව්‍යයෝ* 1988, කම්කරු මාවත ප්‍රකාශන, පි.2.

[44] එම, 49-50 පිටු.

[45] එම, 4 පිට.

[46] *The Transitional Program for Socialist Revolution,* සමාජවාදී විප්ලවය සඳහා සංක්‍රමන ක්‍රියාමාර්ගය, (නිව් යෝර්ක්: පාත් ෆයින්ඩර්, 2001), 189-90 පිටු.

© www.wsws.org